**මාන්තායි නැගෙනහිර ප්‍රාදේශීය සභාව**
**මුලතිව් දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුලි 13 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ඔක්තෝබර් 05 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඒවා විගණනයට ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතුව තිබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුය. | ඉදිරි කාලයේදී හෙළිදරව් කරනු ලබන බව දන්වා සිටිමි. |

**(ආ) ප්‍රමාණාත්මක ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | පොන්නගර් වෙළෙඳපොළ කඩකාමර සංකීර්ණයේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල නොදැක්විම හේතුවෙන් ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | ඓතිහාසික පිරිවැය/තක්සේරු වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඉදිරි වර්ෂ ගිණුම් වාර්තාවල ඇතුළත් කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | කාර්යාල උපකරණ 05ක වටිනාකම එකතුව රු.369,029ක් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ලීබඩු හා සවිකිරීම් ලෙස දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල ලීබඩු හා සවි කිරීම් වටිනාකම රු.369,029කින් වැඩියෙන් සහ කාර්යාල උපකරණ වටිනාකම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඉදිරිකාලයේදි මෙම අඩුපාඩුව සිදුනොවන බව දන්වා සිටිමි. |
| (iii) | යන්ත්‍රෝපකරණ 09ක වටිනාකම එකතුව රු. 239,000ක් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ලීබඩු හා සවිකිරීම් ලෙස දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල ලීබඩු හා සවි කිරීම් වටිනාකම රු.239,000කින් වැඩියෙන් දක්වා තිබූ අතර යන්ත්‍රෝපකරණ වටිනාකම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල නිසි අයුරින් දැක්වීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඉදිරි කාලයේදි මෙම අඩුපාඩුව සිදුනොවන බව දන්වා සිටිමි. |
| (iv) | පිරියත හා යන්ත්‍රෝපකරණ 11ක වටිනාකම එකතුව රු.931,000ක් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල කාර්යාල උපකරණ ලෙස දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල කාර්යාල උපකරණ වටිනාකම රු.931,000කින් වැඩියෙන් දක්වා තිබූ අතර පිරියත හා යන්ත්‍රෝපකරණ වටිනාකම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල නිසි අයුරින් දැක්වීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඉදිරි කාලයේදි මෙම අඩුපාඩුව සිදුනොවන බව දන්වා සිටිමි. |
| (v) | පරිගනක හා උපාංග 37ක වටිනාකම එකතුව රු.959,750ක් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල කාර්යාල උපකරණ ලෙස දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල කාර්යාල උපකරණ වටිනාකම රු.959,750කින් වැඩියෙන් දක්වා තිබූ අතර පරිගනක හා උපාංගවල වටිනාකම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල නිසි අයුරින් දැක්වීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඉදිරිකාලයේදි මෙම අඩුපාඩුව සිදුනොවන බව දන්වා සිටිමි. |
| (vi) | ලීබඩු හා සවිකිරීම් 06ක වටිනාකම එකතුව රු.236,470ක් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල කාර්යාල උපකරණ ලෙස දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල කාර්යාල | ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල නිසි අයුරින් දැක්වීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඉදිරිකාලයේදි මෙම අඩුපාඩුව සිදුනොවන බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| | උපකරණ වටිනාකම රු.236,470කින් වැඩියෙන් දක්වා තිබූ අතර එලෙසම ලීබඩු හා සවිකිරීම්වල වටිනාකම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (vii) | සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂයේ වියදම් ණයහිමියෝ ගිණුමට සලසා තිබූ එකතුව රු.393,192ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ණයහිමි ගිණුමෙහි හර නොකර වෙනත් බැරකම් ගිණුමෙහි හර ශේෂයක් ලෙස දැක්වීම නිසා වියදම් ණයහිමි ගිණුමේ ශේෂය රු.393,192කින් වැඩියෙන් දක්වා තිබුණි. | නිසි අයුරින් ගැලපීම් සිදුකළ යුතුවේ. | ඉදිරි කාලයේදී මෙම අඩුපාඩුව සිදුනොවන බව දන්වා සිටිමි. |
| (viii) | සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂයේ වියදම් ණයහිමියෝ ගිණුමට වැඩිපුර සලසා තිබූ එකතුව රු.21,641ක් සමාලෝචිත වර්ෂයේ සමුච්චිත වර්ෂයට මාරු නොකර මූල්‍ය ප්‍රකාශනවල හිඟහිටිව පවතින අනෙකුත් රාජ්‍ය ආදායම්වලින් අඩුකර දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ හිඟහිටිව පැවැති රාජ්‍ය ආදායම් රු.21,641කින් අඩුවෙන් දක්වා තිබුණි. | සභාවේ සමුච්චිත අරමුදල් ගිණුමට ගැලපීම් සිදුකර නිවැරදි කිරිමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ජර්නල් සටහන් මාර්ගයෙන් නිවැරදි කර ඇත. |
| (ix) | පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සභාවට ලබාදී තිබූ එකතුව රු.7,290,725ක් වූ පිකප්, ට්‍රැක්ටර් සහ උතුරු පළාත් ප්‍රධාන ලේකම්වරයා විසින් ලබාදී තිබූ රු.1,010,000ක් වටිනා ට්‍රැක්ටරය ආදිය සභාවට අයත් නොවුවද, එහි වටිනාකම් ප්‍රාදේශීය සභාවේ සමාලෝචිත වර්ෂය සඳහා වූ ගිණුම්වල ඇතුළත් කර තිබූ නිසා ස්ථාවර වත්කම්වල වටිනාකම රු.8,310,725කින් වැඩියෙන් දක්වා තිබුණි. | සභාවේ නමට අයිතිය පවරා ගැනීමට හෝ නැතහොත් එහි වටිනාකම සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරිමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අංක WP PF 7726 දරන ඩබල් කැබ් පිකප් රථය ලීසිං අවසන් වීමෙන් පසුව අයිතිය මාරු කරනු ලබන බැවින් එම වාහනයේ වටිනාකම අවසන් ගිණුම්වල එකතු කර ඇත.අයිතිය මාරුකිරිමේ අයැදුම්පත්‍ර මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට යවනු ලැබූ බැවින් අපගේ වත්කමක් ලෙස ගණනය කරන ලදි. අංක EP RB 9385 දරන ට්‍රැක්ටරයේ අයිතිය මාරුකිරිම සඳහා භාරදී ඇති බැවින් එම වාහනයේ වටිනාකමද අපගේ වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල එකතු කර ඇත. |

### (ඇ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉඩම්, ගොඩනැගිලි, ළිං, ණයගැතියන් සහ වියදම් ණයහිමියන් ගිණුම් ශේෂවලට අදාල එකතුව රු. මිලියන 69.29ක් සඳහා ඉඩම් හිමිකම් ඔප්පු, මිනින්දෝරු ප්ලෑන සහ වටිනාකම් තක්සේරු සහතික, ඓතිහාසික පිරිවැය පත්‍රිකා, කර්මාන්ත ලිපිගොනු සහ ශේෂ සනාථ කිරීම් ආදිය විගණනයට නොලැබීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස පිළිගෙන සනාථ කළ නොහැකි විය. | අනාවරණය කර ඇති ලිඛිත ලේඛන ලබාගෙන නියමිත පරිදි ගොනුගත කිරීමට සභාව විසින් එලදායි ක්‍රියාමාර්ග ගත යුතුය. | ඉඩම්වල හිමිකම් ඔප්පු නොමැති නිසා මිල තක්සේරු කළ නොහැකි විය. ලැබූ වහාම තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු පිරිවැය තක්සේරු කර ගිණුම් වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. ඓතිහාසික පිරිවැය පත්‍රිකා නඩත්තු කිරිමට ක්‍රියාමාර්ග ගෙන ඇත. කර්මාන්ත ලිපිගොනු අප සතුව පවතී. එය පදනම් කරමින් වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලේඛන ලැබූ වහාම නියමිත අයුරින් පවත්වාගෙන යනු ලබන බව දන්වා සිටිමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) | II පරිච්ඡේදයේ රීති 66 | වර්ග 06 කට අයත් හිඟ ආදායම් එකතුව රු.22,662,84ක් අයකිරීම සඳහා එලදායි ක්‍රියාමාර්ග සභාව විසින් ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකරගැනීම සඳහා සභාවේ ලේකම්වරයා විසින් එලදායි ක්‍රියාමාර්ග ගත යුතුය. | ඉදිරි කාලයේදි අයකිරිම් වැඩි කිරිමට කටයුතු කරනු ලැබේ. |
| (ii) | III පරිච්ඡේදයේ රීති 33 | වරිපනම් බදු සම්බන්ධයෙන් සමීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගෙන නොතිබුණි. | වරිපනම් බදු තක්සේරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් නියමිත කාලයේදි ගත යුතුය. | වරිපනම් බදු සම්බන්ධයෙන් තක්සේරු කිරීම් සඳහා අඛණ්ඩ උත්සාහයන් සිදු කරමින් පවතී. |
| (iii) | V පරිච්ඡේදයේ රීති 140 | කොන්ත්‍රාත්කරුවන් 06දෙනෙකුට සමාලෝචිත වර්ෂයේ අවසාන කාර්තුවේ ගෙවා තිබූ රු.5,181,804ක අත්තිකාරම් නිරවුල් නොකර පැවැති අවස්ථා 12ක් විගණනයේදි නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත් කාර්යයන් අවසන් නොකරන ලද කොන්ත්‍රාත්කරුවන්ට අත්තිකාරම් ගෙවීම වැලැක්වීමට පියවර ගත යුතුවේ. | වර්තමානයේ නිරවුල් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | මුදල් රෙගුලාසි 110 | පාඩු පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි | ලේඛන, මේ දක්වා යාවත්කාලීන කර පවත්වාගෙන යාමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | පාඩු පිළිබඳ ලේඛනය පවත්වා ගෙන යනු ලැබේ. එය සම්පූර්ණ කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ii) | මුදල් රෙගුලාසි 214 | බැරකම් පිළිබඳ ලේඛනය | ලේඛන, මේ දක්වා යාවත්කාලීන කර පවත්වාගෙන යාමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | බැරකම් පිළිබඳ ලේඛනය පවත්වා ගෙන යනු ලැබේ. එය සම්පූර්ණ කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (iii) | මුදල් රෙගුලාසි 395 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ බැංකුවේ හඳුනා නොගත් සෘජු තැන්පතු රු.198,48ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට 2020 පෙබරවාරි 28 දින වන විටත් සභාව අපොහොසත් වී තිබුණි. | මාසිකව සෘජු තැන්පතු නිසි පරිදි හඳුනාගෙන ලේඛනගත කිරීමට ඵලදායී ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. | වර්තමානයේ හඳුනාගෙන ආදායමට මාරු කර ඇත. |
| (iv) | මුදල් රෙගුලාසි 454(2) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි | ලේඛනය නඩත්තු කිරීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (v) | මුදල් රෙගුලාසි 571 | කොන්ත්‍රාත්කරුවන් 08දෙනෙකු විසින් සිදු කළ කොන්ත්‍රාත් කාර්යයන් ඇප තැන්පතු, ආපසු ගෙවිය යුතු ලංසු ඇප තැන්පතු 03ක් සම්බන්ධයෙන් ඵලදායී ක්‍රියාමාර්ග නොගෙන වර්ෂ 01 සිට වර්ෂ 02ක් දක්වා රු.594,294 ක් පොදු තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි. | නියමිත කාලය තුළ ආපසු ගෙවිය යුතු තැන්පතු සම්බන්ධයෙන් සුදුසු පියවර ගතයුතුය. | ඇප තැන්පතු ආපසු ලබාගන්නා ලෙසට දැනුම් දී ඇත. එය නිදහස් කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>ලංසු ඇප තැන්පතු සම්බන්ධයෙන් ආපසු ලබාගන්නා ලෙසට දැනුම් දී ඇත. නමුත් ඔවුන්ගෙන් ඉල්ලීම් ලැබී නොතිබුණි. එමනිසා, ඒවා ආදායම් ලෙස මාරුකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (vi) | මුදල් රෙගුලාසි 845(1) | රාජකාරි දුරකථන ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. | නිසිපරිදි රාජකාරි දුරකථන ලේඛනයක් නියමිත පරිදි නඩත්තු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු වේ. | නඩත්තු කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (vii) | මුදල් රෙගුලාසි 891(1) | ඇප ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. | නියමිත පරිදි ඇප ලේඛනය නඩත්තු කිරීමට ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. | වර්තමානයේ නඩත්තු කරනු ලැබේ. |

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

| | | | | |
|---|---|---|---|---|
| (i) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණික ඇගැයීම් කමිටුවේ පැමිණීමේ ලේඛන පවත්වාගෙන නොතිබුණි. | පැමිණීමේ ලේඛන අඛණ්ඩව නඩත්තු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. | ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ii) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | ලංසු කැඳවීමේ ලේඛනය පවත්වාගෙන ගොස් නොතිබුණි. | අඛණ්ඩව නඩත්තු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. | වර්තමානයේ නඩත්තු කටයුතු කරනු ලැබේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 16,588,769 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 9,371,183ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

------------------------

#### 2.2.1 ඇස්තමේන්තු කළ ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තු කළ ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | කුලී | 887,000 | 728,798 | 640,348 | 225,612 | 779,000 | 823,045 | 449,118 | 305,442 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 272,000 | 479,765 | 479,765 | – | 141,000 | 434,634 | 434,634 | – |
| (iii) | වෙනත් ආදායම් | 8,796,500 | 22,092,399 | 8,041,286 | 22,437,261 | 8,712,500 | 14,717,862 | 5,311,389 | 9,474,958 |
| | එකතුව | **9,955,500** | **23,300,962** | **9,161,399** | **22,662,873** | **9,632,500** | **15,975,541** | **6,195,141** | **9,780,400** |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පැවැති හිඟහිටි ආදායම් එකතුව රු.22,662,873 ක් විය. ඉන් 2019 ජනවාරි 01 දිනට පැවැති හිඟහිටි ආදායම් | සමාලෝචිත වර්ෂය අවසානයේදි අයකර නොමැතිව පවතින හිඟහිටි ආදායම් සැසඳීමට හැකි අයුරින් ගිණුම් හා වාර්තා | පිළිතුරු ලබාදී නොමැත. |

| | | |
| --- | --- | --- |
| එකතුව රු.9,780,400ක් සමාලෝචිත වර්ෂය සඳහා සම්පූර්ණ බිල් කළ ආදායම රු.23,300,962ක් සහ සමාලෝචිත වර්ෂයේ රැස්කළ මුළු ආදායම ආදිය සසඳා පරීක්ෂා කර එහි සත්‍ය හා නිවැරදිභාවය සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂවලත් ගිණුම් ප්‍රකාශනවල දක්වා තිබූ ආරම්භක හිඟහිටි ආදායම්, ලැයිස්තුගත කළ ආදායම්, රැස්කළ ආදායම් සමග සසඳා නිවැරදි කිරීමේදි අවසාන හිඟහිටි ආදායම් ලැබී නොතිබීම නිසා විගණනයේදි සතුටුදායක ලෙස පිළිගෙන තහවුරු කළ නොහැකි විය. | සැකසිය යුතු අතර මූල්‍ය ප්‍රකාශනවලද එම වටිනාකම නිසි පරිදි ඉදිරියට ගෙන ඒමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | |

## 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

----------------------------------

අයවැය ඇස්තමේන්තු නිවැරදි ආකාරයෙන් සකස් නොකිරීම සහ ඇස්තමේන්තු නිවැරදි ආකාරයෙන් සැලැසුම් කර වැඩසටහන් සම්පාදනය නොකිරීම නිසාත් ඇස්තමේන්තු කළ ආදායම් සහ තථ්‍ය ආදායම් අතර විචලනයන් මතුවී තිබුණි.

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් කඩ කුලී, දඩ මුදල්, බදු ගාස්තු, බර වාහන සේවා ගාස්තු සහ ප්‍රමාද ගාස්තු ආදිය අයකර ගැනීමෙහි මන්දගාමී ස්වරූපයක් නිරීක්ෂණය විය. එසේම සමාලෝචිත වර්ෂයේ රැස් කළ මුළු ආදායම වන රු.මිලියන 1.40ක් වනාහි, සමාලෝචිත වර්ෂයට අදාළ හිඟහිටි ආදායම් රු.මිලියන 14.29 කින් සියයට 10 ක් මෙන්ම පසුගිය වර්ෂවලට අදාලව අයකර ගත යුතුව තිබූ හිඟහිටි ආදායම් එකතුව රු.මිලියන 24.29 කින් සියයට 06 ක්වී තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂ අවසානයේ පැවැති හිඟ ආදායම්වල කාල විශ්ලේෂණය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | නියමිත කාලය තුළ සභාවට ලැබිය යුතු ආදායම් අයකර ගැනීමටත් ආදායම් හිඟ හිටිව පැවතීම වැලැක්වීමටත් සභාවේ ලේකම්වරයා විසින් කඩිනමින් ඵලදායි ක්‍රියාමාර්ග ගතයුතු වේ. | හිඟ ආදායම් අයකිරිමට ක්‍රියාමාර්ග ගෙන ඇත. කාල විශ්ලේෂණය පිළියෙල කර ඇත. |

## 2.2.3 වරිපනම් හා බදු

----------------------

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති පරිච්ඡේදයේ III පරිච්ඡේදයේ 32 වගන්තිය ප්‍රකාරව සභාව පසුගිය වර්ෂ 10ක කාලය සඳහා වරිපනම් බදු තක්සේරු ලේඛනය පවත්වා නොතිබුණි. | වරිපනම් බදු තක්සේරු ලේඛන පවත්වාගෙන යාමට සභාව විසින් ක්‍රියාමාර්ග ගතයුතු වේ. | වරිපනම් බදු තක්සේරු ලේඛන පවත්වා ගෙන නොතිබුණි. මේ පිළිබඳ ඉදිරි කටයුතු සිදුකරමින් වෙමින් පවතී. |

**2.2.4 බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියමනයන් ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ ස්ථාපිත කර තිබූ පුද්ගලික සමාගමක විදුලි සංදේශ කුළුණු 03 ක් සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම්, මූලික සැලසුම් අනුමත කිරීම්, අනුකූලතා සහතික නිකුත් කිරීම සහ අධීක්ෂණ අනුමැතිය යන සතර වර්ගයේ ගාස්තු මුළුමනින්ම අයකර නොතිබූ බව නිරීක්ෂණය වූ අතර එවැනි ගාස්තුවල මුළු වටිනාකම ද තක්සේරු කර පසුගිය වර්ෂ 05ක කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවලට ගෙනැවිත් නොතිබුණි. | හිඟ ආදායම් ගණනය කර අයකිරීමටත් වාර්ෂිකව එම ගාස්තු අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමටත් ඒවා සභාවේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමටත් සභාව විසින් ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතුවේ. | විදුලි සංදේශ කුළුණු තුනම හමුදා කඳවුරු තුළ ස්ථාපිත කර ඇත. මෙම කාරණා සඳහා ඉඩම් හිමියන් තිදෙනෙකුගේ අනුමැතිය අවශ්‍ය කෙරේ. එසේ වුවත්, වර්තමානයේ මෙම ඉඩම් හමුදාවට පවරා දී ඇත. මේ නිසා අපගේ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා 1987 අංක 15 දරන පනතේ 17.2 වගන්තිය අනුව බාධා වී ඇත. එසේ වුවත්, අදාළ ආයතනවලට නියමිත ගාස්තු ගෙවන ලෙස අප විසින් දන්වා තිබුණත් ඔවුන් විසින් ගෙවීම් කර නොතිබුණි. |

**2.2.5 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු එකතුව රු.21,339,235ක් ලැබිය යුතුව තිබුණි. | උතුරු පළාත් ප්‍රධාන ලේකම්වරයාගේ ලැබිය යුතු මුදල් නියමිත කාලය තුළ ලබාගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් ගතයුතු වේ. | ඉල්ලීම් සිදුකර තිබුණත් මේ දක්වා ලැබී නොතිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් සහ ජනතා සුවය, පහසුකම් හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ සියළුම වර්ගයේ ක්‍රියාකාකරකම් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් විධිමත්ව සකස් කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර රයට අනුකූලව ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරිමට සභාව විසින් ඵලදායි ක්‍රියාමාර්ග ගතයුතු වේ. | ඉදිරි කාලයේදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරිමට කටයුතු කර ඇත. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ බැහැර කරනු ලබන කැලිකසළ, ගිනිතැබීම හා වලදැමීම යන කාර්යයන් පමණක් සභාව විසින් සිදු කරන අතර කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘති වැනි ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාත්මක කිරීමට ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම තවදුරටත් මන්දගාමී මට්ටමේ පැවතුණි. | කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘති වැනි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සභාව විසින් ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතු වේ. | ඉදිරියේදී මෙවැනි ක්‍රියාමාර්ග ක්රියාත්මක කිරිමට මූලික කටයුතු සිදුකර ඇත. |

(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2030 වර්ෂයේ තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සභාව විසින් ළඟා කර ගත යුතු ඉලක්ක සහ එම ඉලක්ක ළඟාකර ගැනීමේදි පවතින දුෂ්කරතාවයන් මෙන්ම ඉදිරි ක්‍රියාකාරකම් මැනීම සඳහා සුදුසු දර්ශකයන්ද 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ ප්‍රකාරව පසුගිය දෙවර්ෂය පුරා ස්ථාපිත කිරිමට කටයුතු කර නොතිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්ක සථාපිත කර එහි වාර්ෂික ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පිළිබඳ දැනුවත් විය හැකි දර්ශකයන්ද ස්ථාපිත කිරීමට සභාව විසින් ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතු වේ. | ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව අයවැය ඇස්තමේන්තුව ප්‍රකාරව ක්‍රියාත්මක කළයුතුව පැවැති සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක නොකර එකතුව රු.මිලියන 23.2 ක අරමුදල් පසුගිය වර්ෂ 01 සිට 06ක් දක්වා කාලයක් බැංකුවක ස්ථාවර තැන්පතු ගිණුමක ආයෝජනය කර තිබූ බව නිරීක්ෂණය විය. | මහජනතාවට ප්‍රතිලාභ ලැබිය හැකි ක්‍රියාකාරකම්වල ආයෝජනය කිරීමටත් මහජන සුභසාධනය ස්ථාපිත කළ හැකි අයුරින් එම අරමුදල් උපයෝගී කරමින් ආදායම් ඉපැයීම වර්ධනය කර ගැනීමටත් සභාව විසින් ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අප සභාවේ ක්‍රියාකාරකම් අඛණ්ඩව ක්‍රියාත්මක කිරිම සඳහා අරමුදල් අවශ්‍ය බැවින්, බැංකුවෙන් ලැබෙන ස්ථාවර තැන්පතු පොලී ආදායම විශාල ප්‍රමාණයක් විම නිසා අපගේ ආදායමක්ව තිබේ. |
| (ආ) | සභාවට පරිත්‍යාග ලෙස ලැබී තිබූ ලී බඩු යන්ත්‍ර හා කාර්යාල උපකරණ 134 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම්වල වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. කෙසේ වුවද, එවැනි උපකරණ ලැබූ දිනයන්, ඒවායේ භාවිතය, ආර්ථික ආයු කාලය ආදිය පසුගිය වර්ෂයක කාලය තුළ විගණනය දැනුවත් කර තිබුණි. | රජයේ තක්සේරුකරු හෝ අනුමත තක්සේරුකරුවෙකු මාර්ගයෙන් තක්සේරු කිරිම සිදුකර පරිත්‍යාගයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට සභාව විසින් ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතු වේ. | මෙම භාණ්ඩ සියල්ල පරිත්‍යාග ලෙස ලැබී තිබුණි. මේවා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, ජලසම්පාදන දෙපාර්තමේන්තුව ආදිය විසින් භාවිතා කළ තත්ත්වයෙන් අප වෙත ලැබූ ඒවා විය. එමනිසා ඒවායේ වටිනාකම් එකතු කර නොතිබුණි. ඉතා කඩිනමින් වටිනාකම් තක්සේරු කර ඇතුළත් කරනු ලබන බව සහතික කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සභාවේ අරමුදලින් එකතුව රු.මිලියන 20 කට ඇස්තමේන්තු කර තිබූ අභ්‍යන්තර මාර්ග 11ක් ප්‍රතිසංස්කරණ කාර්යයන් ක්‍රියාත්මක නොකර මුළුමනින්ම අතහැර දමා තිබුණි. | සභාවේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ ඇතුළත් කළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පිළිතුරු ලබා දි නොමැත. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

### තනතුරු පුරප්පාඩු සහ අතිරික්තයන්

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අදාළව අනුමත කළ සේවක සංඛ්‍යාව, තාක්ෂණික නිලධාරී, ආදායම් පරීක්ෂක තනතුරුවල සියයට 50 ක පුරප්පාඩු පවතින අතර පිළිවෙලින් සංවර්ධන කාර්යයන් සහ ආදායම් අයකර ගැනීම් විධිමත්ව ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණු බව විගණනයට නිරීක්ෂණය විය. | සේවක තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ පරිදි ප්‍රසිද්ධ කිරිම මගින් ලබා ගැනීම සඳහා සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | තනතුරු පුරප්පාඩු පිරවීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |

## 3.4 මතභේදාත්මක ස්වරූපයේ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ විවිධ ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපන කාර්යයන් සඳහා ප්‍රජාපාදක ආයතන 04ක් සහ කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට සමාලෝචිත වර්සයේ නොවැම්බර්, දෙසැම්බර් මාසවලදි වටිනාකම එකතුව රු.මිලියන 5.18ක් සභාවේ අරමුදල්වලින් අත්තිකාරම් ලෙස ගෙවා නිරවුල් නොකළ අවස්ථා 12ක් විගණනයේදි නිරීක්ෂණය විය. | සභාවේ අරමුදලින් ක්‍රියාත්මක නොකළ කාර්යයන් සඳහා සභාවේ අරමුදලින් අත්තිකාරම් ගෙවීම වැලැක්වීමට කටයුතු කළ යුතුවේ | වර්තමානයේ නිරවුල් කර ඇත. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවට අයත් දේපල, පිරියත හා යන්ත්‍රෝපකරණ, ලී බඩු හා උපකරණ, පරිගණක හා උපාංග ආදිය 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන මුදල් හා ජනමාධ්‍ය කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පිළිවෙලින් ස්ථාවර වත්කම් ලේඛනයේ සහ පරිගණක උපාංග ලේඛනයේ ලේඛනගත කිරීමට මේ දක්වා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම ලේඛන නියමිත පරිදි නඩත්තු කර යාවත්කාලීන කිරීමටත් සභාව විසින් ඵලදායි ක්‍රියාමාර්ග ගතයුතුය. | වර්තමානයේ නඩත්තු කරනු ලැබේ. |

### 3.4.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ වාර්තා අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 757 අනුව සිදු කළ යුතු පසු විපරම් ක්‍රියාමාර්ග මේ දක්වා මන්දගාමීව පැවතුණි. | වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණ වාර්තාවන් පිළිබඳව පසු විපරම් ක්‍රියාමාර්ග සිදුකිරිම සඳහා සභාව විසින් කටයුතු කළ යුතු වේ. | ඉදිරි ක්‍රියාමාර්ග සිදුකෙරෙමින් පවතී. |

## 3.6 ප්‍රසම්පාදනය

### 3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂවල සභාවට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රසම්පාදන කාලසටහන් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන කාලසටහන් ආදිය පිළියෙල කිරිමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි කාලයේදි ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරිම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා සිටිමි. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය සැලැස්ම නිවැරදි ක්‍රියාපටිපාටියක් අනුගමනය කරමින් සැලසුම් කර පිළියෙල නොකිරීම නිසා වැය විෂයයන් 05ක ඇස්තමේන්තුගත වියදම් සහ තථ්‍ය වියදම් අතර සියයට 7 සිට සියයට 25ක් දක්වා පරාසයක හිතකර සහ අහිතකර විචලනයන්ද, ආදායම් වර්ග 05 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් අතර හිතකර සහ අහිතකර විචලනයන් පිළිවෙලින් සියයට 17 සිට සියයට 492 ක් දක්වා පරාසයකිනුත් පැවතුණි. | සභාව විසින් උචිත කරුණු සැලැකිල්ලට ගෙන ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකි වාර්ෂික අයවැය සැලැස්මක් සකස් කර මහජන එකඟතාවයට ඉදිරිපත් කර එය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරිමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතු වේ. | ප්‍රාදේශීය සභාව නොදියුණු ප්‍රදේශයක් බැවින් ආදායම් මූලාශ්‍රයන් ඉතාමත් අඩු වශයෙන් පවතී. මේ නිසා ආදායම් රැස්කිරීමෙහිත් දුෂ්කරතාවන් මතුවේ. ලැබෙන ආදායම්වලින් පමණක් අපගේ වියදම් සිදු කෙරේ. මේ නිසා අයවැය මඟින් අපේක්ෂිත ඉලක්ක වෙත ළඟා විය නොහැකි තත්ත්වයක් පවතී. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ කටයුතු විගණනය කර කාර්යක්ෂමව එහි ක්‍රියාකාරකම් කරගෙන යාම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද, අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තා පසුගිය වර්ෂ දෙකෙහිදි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තා පිළියෙල කිරිමට පියවර ගත යුතුවේ. | ලේකම්වරයා විසින් අභ්‍යන්තර විගණකවරයා පත්කර තිබූ අතර සේවක පුරප්පාඩු අඛණ්ඩව පැවැතීම නිසා කාර්යයන් වෙනමම කර ගෙන යා නොහැකි වී ඇත. |